# අන්දරබැද්ද තෙළිඟු ජනතාවගේ සාම්ප්‍රදායික සංස්කෘතියට වෙනත් සංස්කෘතිවලින් එල්ල වී ඇති බලපෑම් පිළිබඳ සමාජ මානව විද්‍යාත්මක අධ්‍යයනයක්

**ජයසේන එස්.ඩබ්ලිව්.ඒ.ආර්.**[1]

ඕනෑ ම සමාජයක් තුළ පවතින සංස්කෘතිකාංග කාලානුක්‍රමිකව විවිධ වෙනස්වීම්වලට නතුවීම නොවැළැක්විය හැකි කරුණකි. මෙම වෙනස්කම් සිදුවීමට බලපාන ප්‍රධාන ම හේතුවක් වන්නේ යම්කිසි සමාජයක සාම්ප්‍රදායික සංස්කෘතියට වෙනත් සංස්කෘතිවලින් එල්ල වී ඇති බලපෑම් ය. අස්පර්ශනීය සංස්කෘතික උරුමයක් වශයෙන් සැලකෙන, මෙරට ප්‍රාථමික ජන කොට්ඨාසයක් වන තෙළිඟු ජනයාගේ සංස්කෘතියට ද වෙනත් සංස්කෘතිවලින් බලපෑම් එල්ල වී ඇත. එලෙස එල්ල වී ඇති බලපෑම් පිළිබඳ සිදුකරන ලද මෙම අධ්‍යයනයේ දී අධ්‍යයන ප්‍රදේශය වශයෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 76, පාඬිපංචාව ග්‍රාම නිලධාරි වසමට අයත් අන්දරබැද්ද ග්‍රාමය යොදාගත් අතර, මෙම ප්‍රදේශයේ ජීවත්වන තෙළිඟු ජනයාගේ ජන ජීවිතය හා බැඳි සාම්ප්‍රදායික සංස්කෘතිකාංගවලට වෙනත් සංස්කෘතිවලින් එල්ල වී ඇති බලපෑම් මොනවාද? යන්න විමර්ශනය කිරීම මෙම අධ්‍යයනයේ මූලික ම අරමුණ විය. මෙහිදී දත්ත එක්රැස් කිරීම සඳහා ක්ෂේත්‍ර සහ ක්ෂේත්‍ර නොවන අධ්‍යයනය භාවිතා කරන ලද අතර මෙහි මූලික පදනම වූ තෙළිඟු ජනතාව ක්‍රි.පූ. 6 වැනි සියවසේ ආර්යයන් මෙරටට පැමිණෙන විට සංක්‍රමණය වූ ජන කොට්ඨාසයකි. එලෙස පැමිණි මොවුන් පසු කාලීනව ශ්‍රී ලංකාවේ සිංහල සංස්කෘතියත් කතෝලික ආගමත් සමඟ සම්මිශ්‍රණය වීම තුළින් ඔවුන්ගේ බොහෝ සංස්කෘතික අනන්‍යතා වියැකී යාමකට ලක් ව ඇත. නමුත් ඔවුන්ගේ ඇතැම් සංස්කෘතිකාංග තවමත් සාම්ප්‍රදායික ස්වරූපයෙන් ම පවතී. ඒ අතර ඔවුන්ගේ ජීවන උපායන්, මංගල හා අවමංගල්‍ය චාරිත්‍ර, මල්වර චාරිත්‍ර ආදී වූ ඇදහිලි විශ්වාසයන් මෙන් ම ඔවුනගේ කලාවන් ද ප්‍රධාන වේ. වර්තමානය වන විට ස්වකීය අනන්‍යතා රැකගැනීමකට වඩා එම අනන්‍යතාවන් ලාභ ඉපයීමේ මාර්ගයක් බවට පත්කරගෙන ඇති බව මෙම අධ්‍යයනයේ දී පැහැදිලි වූ අතර, ඔවුන්ගේ සාම්ප්‍රදායික සංස්කෘතියෙහි වෙනස්වීම් රැසක් පිළිබඳ තොරතුරු ද හඳුනා ගැනීමට හැකියාව ලැබිණි. මේ අනුව අන්දරබැද්ද තෙළිඟු ගම්මානයෙහි ජීවත්වන මෙම තෙළිඟු ජනතාවගේ ජන ජීවිතය හා බැඳි සංස්කෘතිකාංගවල අනන්‍යතා මෙරට සිදුවන සමාජ වෙනස්වීම්වලට අනුව ක්‍රමික ව වෙනස්වීම්වලට නතුවෙමින් සිංහල, කතෝලික සහ අනෙකුත් සංස්කෘතික අනන්‍යතා සමඟ සම්මිශ්‍රණය වී ඇත. එමගින් ඔවුන්ගේ සංස්කෘතියට එල්ල වී ඇති බලපෑම් හේතුවෙන් ඔවුන්ගේ සමාජ සංස්ථා මත පදනම් ව පැවති හර පද්ධතිය බිඳ වැටීමකට ලක් ව ඇති බව මෙම අධ්‍යයනයේ දී නිගමනය කළ හැකි විය. එසේ ම අභාවයට යමින් පවතින තම තෙළිඟු ජන සංස්කෘතිය අනන්‍යතාවක් වශයෙන් රැකගැනීමට එම ජන සමාජයෙහි වත්මන් පරපුර උත්සුක වන්නේ නම් එය අනාගත පරපුරට යහපත් ක්‍රියාවක් වනු ඇත.

**මුඛ්‍ය පද** : තෙළිඟු ජනයා, අන්දරබැද්ද, සංස්කෘතිකාංග, සංස්කෘතික වෙනස්වීම

---

[1] භාෂා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. ruwanmalianuradha@gmail.com